# නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්,(දෙපාර්තමේන්තුමය) III ශ්‍රේණිය තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2017

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්,(දෙපාර්තමේන්තුමය) III ශ්‍රේණිය තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන නිලධාරීන්ගෙන්/සමුපකාර සංවර්ධන නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2017.08.11** දින වේ.

**02. බඳවා ගැනීම සඳහා වන සේවා කොන්දේසි ඃ-**

2.1 මෙම තනතුර ස්ථිරය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.

2.2 මෙම දැන්වීමට අනුව ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ.

2.3 මෙම පත්වීම ලබන අය නැගෙනහිර පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කළ යුතුය. එමෙන්ම නැගෙනහිර පළාතේ අවුරුදු 10 ක අනිවාර්ය සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු වේ.

2.4 ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන නිලධාරීන්/සමුපකාර සංවර්ධන නිලධාරීන් තමන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තෝරා ගන්නා අය නිදහස් කිරීමට එකඟතාවය පළ කළ යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ නොකර ඉදිරිපත් කරන අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03. වැටුප ඃ-** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ට අනුව, (SL1-2016)
රු.47,615-10x1,335-8x1,630-17x2,170- රු.110,895/-

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදුකරනු ලැබේ.

**04. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්**

**4.1 වයස් සීමාව ඃ-** සීමිත පදනම මත බඳවා ගැනීමේදී උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**4.2 යෝග්‍යතාවය ඃ-**

අ. දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

ආ. සමුපකාර සංවර්ධන නිලධාරී I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**05 පොදු සුදුසුකම් ඃ-**

අයදුම්කරුවන් ඉහත සඳහන් තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**06 බඳවා ගැනීමේ ක්‍රමය ඃ-**

6.1 නැගෙනහිර පළාත් සභාව සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට, රජයේ චක්‍රලේඛවලට හා ඉහත 2.2 හි සඳහන් විධිවිධානවලට අනුකූලව බඳවා ගනු ලැබේ. අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම දැන්වීමෙහි සඳහන් සුදුසුකම් සියල්ල පරීක්ෂා කරනු ලබන අතර, අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් තනතුර සඳහා වන හිමිකම අවලංගු කරනු ලැබේ.

6.2 පුරප්පාඩු පවතින සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාල පහත දැක්වේ.

| මඩකලපුව | අම්පාර | කල්මුණේ |
|---|---|---|
| ✓ | ✓ | ✓ |

6.3 සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර තනතුරට අදාළ සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර ඉල්ලා ඇති සුදුසුකම් වලට අදාළ පරීක්ෂණවල ප්‍රතිඵල ද නිලවශයෙන් නිකුත් වී තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින අය අයදුම් කිරීම වරදක් සේ සලකනු ලබන අතර, සුදුසුකම් නොමැතිව එවනු ලබන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් ඃ-**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙද්දී හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඕනෑම අවස්ථාවකදී ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවල. ඉහත 6.3 පිළිබඳ අයදුම්කරුවන්ගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**08. අයදුම්කිරීමේ ක්‍රමය ඃ-**

8.1 මෙම දැන්වීමෙහි අවසානයේ යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4(සෙ.මී.21x29) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම **පමණක්** ප්‍රයෝජනයට ගනිමින් **අංක 1.0 සිට 5.2 දක්වා පළමු පිටුවටද, අංක 5.3 සිට 11.0 දක්වා දෙවන පිටුවටද** ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

8.2 **නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති, ආදර්ශ අයදුම්පත්‍රයේ ඇති විභාග සංකේත අංකය නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.** නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවල අලාභය අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු සැලකිලිමත් විය යුතුය. එසේ නොවුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

8.3 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාග සංකේත අංකය **EX/Rec/17/16** යන්න සඳහන් කළ යුතුය.

8.4 අයදුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියා/දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරියේ අත්සන් කොට, එම අත්සන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියා/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර, දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කර එවිය යුතුය.

8.5 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2017.08.11** වැනි දින හෝ ඊදිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තැපෑලේදී අස්ථානගතවන අයදුම්පත්‍ර පිළිබඳ කිසිදු වගකීමක් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාරගනු නොලැබේ. **(ඉල්ලුම්පත්‍ර ලේකම්වරයාගේ පෞද්ගලික නමට එවීමෙන් වැළකිය යුතුය.)**

**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැගෙනහිර පළාත,**
**අංකඃ 198, ඇතුල් වරාය පාර,**
**ත්‍රිකුණාමලය.**

**09.** අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**i.** ජාතික හැඳුනුම්පත. **ii.** වලංගු විදේශ ගමන් බලපත්‍රය. **iii.** වලංගු රියදුරු බලපත්‍රය.

**10.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී පවත්වනු ලැබේ.

**11.** **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ඃ-**

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| (i) ජ්‍යෙෂ්ඨත්වය | 60 |
| (ii) හැකියාව | 20 |
| (iii) විශේෂ සුදුසුකම් | 20 |
| **මුළු ලකුණු** | **100** |

**(i)** **<u>ජ්‍යෙෂ්ඨත්වය</u>**

දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන නිලධාරී තනතුරේ සේවය කරන ලද එක් එක් පූර්ණ වර්ෂයක් සඳහා වසරකට ලකුණු හයක් (06) බැගින් උපරිම වසර 10 ක කාලයක් හෝ සමුපකාර සංවර්ධන නිලධාරී I වන ශ්‍රේණියෙහි සේවය කරන ලද එක් එක් පූර්ණ වර්ෂය සඳහා වසරකට ලකුණු පහක් (05) බැගින් උපරිම වසර 12 ක කාලයක්, යන දෙකෙන් වැඩි අගය සඳහා ලකුණු හිමි වේ.

**(ii)** **<u>හැකියාව</u>**

(a) බේරුම් කිරීමේ කටයුතු හැසිරවීම වෙනුවෙන් ලකුණු පහක් (05) හිමි වේ.
(b) විශේෂ විගණන හෝ විමර්ශන කටයුතු හැසිරවීම වෙනුවෙන් ලකුණු පහක් (05) හිමි වේ.
(c) විමර්ශන හා සංවර්ධනය සඳහා පරීක්ෂණ පැවැත්වීමේ කටයුතු හැසිරවීම වෙනුවෙන් ලකුණු පහක් (05) හිමි වේ.
(d) නිර්මාණශීලීත්වය/විශේෂ රාජකාරි සඳහා ලකුණු පහක් (05) හිමි වේ. (සමුපකාර සංවර්ධණ කෙෂ්ත්‍රයේ දායකත්වය වෙනුවෙන්)

**(ii)** **<u>විශේෂ සුදුසුකම්</u>**

(a) පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම වෙනුවෙන් ලකුණු හයක් (06) හිමි වේ.
(b) පිළිගත් ආයතනයකින් කෙෂ්ත්‍රයට අදාළව ලබාගත් ඩිප්ලෝමා හෝ ඊට සමාන සුදුසුකම් වෙනුවෙන් ලකුණු හතරක් (04) හිමි වේ.
(c) මව්බස නොවන අනෙක් රාජ්‍ය භාෂාවේ ප්‍රවීණතාවය වෙනුවෙන් උපරිම ලකුණු තුනක් (03) හිමි වේ.
(d) ලබා ඇති ප්‍රශංසා වෙනුවෙන් උපරිම ප්‍රශංසා දෙකක් (02) සඳහා ලකුණු එකක් (01) බැගින් උපරිම ලකුණු දෙකක් (02) හිමි වේ.
(e) සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය වෙනුවෙන් උපරිම ලකුණු පහක් (05) හිමි වේ.

මෙම දැන්වීමෙහි සඳහන් විධිවිධානවල කිසියම් සංශෝධනයක් අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගන්නා තීරණය අවසාන තීරණය වේ. එමෙන්ම මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යම් විශේෂ හේතුවක් මත නොපැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නැගුනහොත් ඒ පිළිබඳව ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. එසේම මෙම තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණයෙන් පිරවීම, කොටසක් පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ බලය නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත පත්කිරීම් බලධාරියා සතු වේ.

එච්.ඊ.එම්.ඩබ්.ජී. දිසානායක,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.

**EX/Rec/17/16**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.)

ආදර්ශ අයදුම්පත්‍රය

**නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්,(දෙපාර්තමේන්තුමය) III ශ්‍රේණිය තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2017**

භාෂා මාධ්‍යය
සිංහල - S දෙමළ - T
(අදාළ ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න)

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..........................................

1.0 1.1 මුලකුරු සමඟ නම : Rev/Mr/Mrs/Miss ..................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු පසුව ලියන්න - උදා* : Mr. PERERA, A.B.C.*)*

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් : ..................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..................................................................

1.3 සම්පූර්ණ නම : ..................................................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ..................................................................

1.4 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - F පුරුෂ - M
*(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)*

1.5 දුරකතන අංකය : ..................................................................

2.0 2.1 ස්ථිර ලිපිනය : ..................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..................................................................

2.2 ස්ථිර ලිපිනය : ..................................................................
*(සිංහලෙන්/දෙමළෙන්)* ..................................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : ..................................................................
*(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)* ..................................................................

3.0 3.1 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් නම්, ජාතික හැඳුනුම්පත් අංකය

3.2 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.3 **2017.08.11** දිනට වයස : වර්ෂ මාස දින

4.0 ජනවර්ගය : සිංහල ශ්‍රී ලාංකික දෙමළ මුස්ලිම් වෙනත්
*(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න)*

5.0 අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ..........................................
(ii) විභාග අංකය : ..........................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය : ..........................................
(ii) විභාග අංකය : ..........................................
(iii) ප්‍රතිඵල

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 3. | |
| 2. | | 4. | |

5.3 අයදුම්කරු පිළිගත් විශ්ව විද්‍යාලයකින්/ආයතනයකින් උපාධියක් ලබා ඇත්නම්,

(i) විශ්ව විද්‍යාලයේ/ආයතනයේ නම : ……………………………………………..………………………

(ii) උපාධිය/ඩිප්ලෝමාව : ……………………………………………..………………………
*(පංති සාමාර්ථයක් ඇත්නම් සඳහන් කරන්න)*

(iii) උපාධි/ඩිප්ලෝමා සහතිකය වලංගු වන දිනය : ……………………………………………………………

5.4 අයදුම්කරු පිළිගත් ආයතනයකින් ක්ෂේත්‍රයට අදාළව ඩිප්ලෝමාවක් ලබා ඇත්නම්,

(i) ආයතනයේ නම : ……………………………………………..………………………

(ii) ඩිප්ලෝමාව : ……………………………………………..………………………
*(පංති සාමාර්ථයක් ඇත්නම් සඳහන් කරන්න)*

(iii) ඩිප්ලෝමා සහතිකය වලංගු වන දිනය : ……………………………………………………………

6.0 වෘත්තීය සුදුසුකම් : ……………………………………….………………………………..…………………

7.0 ඔබ ශ්‍රී ලංකාවේ උසාවියකින් කවර හෝ අපරාධ වරදකට වරදකරු කරනු ලැබ තිබේද? එසේ නම් විස්තර සඳහන් කරන්න. : ………………….……………………………….……………………………..……………..

8.0 නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයෙකු නම් ඃ-

8.1 දෙපාර්තමේන්තුව/කාර්යාලය : ..........................................................................

8.2 වර්තමාන තනතුර : ..........................................................................

8.3 මුල්පත්වීම් දිනය : ..........................................................................

8.4 වර්තමාන තනතුරෙහි ස්ථිර කළ දිනය : ..........................................................................

9.0 **අයදුම්කරුගේ සහතිකය**

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තවද, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය : ……………………..…… ..……………………………

අයදුම්කරුගේ අත්සන

10.0 **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම** *(මෙම දැන්වීමෙහි 8.4 අනුව)*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන …………………………….…………….මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ……………...………… දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

……………………………..

අත්සන සහතික කරන්නාගේ අත්සන

දිනය : ……………………..……

සහතික කරන්නාගේ නම : ……………………..……

තනතුර : ……………………..……

ලිපිනය : ……………………..……

*(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)*

11.0 **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරියකු වශයෙන් සේවය කරන ---------------------------------------- මයා/මිය/මෙනවිය ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරට තෝරා ගතහොත් ඔහු/ඇය දැනට සිටින සේවයෙන් නිදහස් කල හැකි බවත් ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් මෙයින් සහතික කරමි.

……………………………..

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය : ……………………..……

නම : ……………………..……

තනතුර : ……………………..……

ලිපිනය : ……………………..……

*(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)*